# මුලතිව් දිස්ත්‍රික්කයේ ඓතිහාසිකත්වය හෙළි කරන පුරාවිද්‍යාත්මක සාධක

**දම්මි බණ්ඩාර[1] , තරින්දි රංචාගොඩ[2], වාසනා ප්‍රේමචන්ද්‍ර[2], කල්ප අසංග[2], අයි.පී. නිශාන්ත[2], අර්ජුන සමරවීර[3]**

මුලතිව් දිස්ත්‍රික්කය පෞරාණික වශයෙන් වැදගත් බිම් කඩකි. තිස් වසරක් පුරා පැවති අභ්‍යන්තර සිවිල් අර්බුදය නිසා මෙම ප්‍රදේශයේ පිහිටි ආගමික, ඓතිහාසික මෙන් ම පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත ස්ථාන සංචාරකයන්ගේ මෙන්ම පර්යේෂකයන්ගේ අවධානයෙන් ගිලිහී පැවතිනි.

පශ්චාත් යුධ සමයෙහි ශීඝ්‍රයෙන් මානව ග්‍රහණයට නතු වන මෙම භූමි ප්‍රදේශයේ පවතින පුරාවිද්‍යාත්මක වටිනාකමක් සහිත භූමි හඳුනා ගැනීමට පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවට හැකි විය. නව පුරාස්ථාන හඳුනා ගැනීමට මෙන් ම හඳුනා ගෙන පැවති භූමිවල තත්ත්වය පරීක්ෂා කිරීමත් ඒවා මැනවින් වාර්තාගත කිරීමත් මෙම පර්යේෂණය මගින් සිදු වූ කාර්යයකි. එම ස්ථානවල චෛත්‍ය, ලෙන් සංකීර්ණ, පංචාවාස, පධානගර වැනි වාස්තුවිද්‍යාත්මක ලක්ෂණ සහිත බෞද්ධාගමික ගොඩනැගිලි ද හින්දු වාස්තුවිද්‍යාත්මක අංග, ප්‍රතිමා, කැටයම් ආදිය මෙන් ම වාරිතාක්ෂණය ආශ්‍රිත නටබුන් ද විය.

තවමත් ක්‍රියාකාරී මට්ටමෙහි පවතින මෙම ව්‍යාපෘතිය තුළ දී සැලකිය යුතු ශිලාලේඛන සංඛ්‍යාවක් පිළිබඳව තොරතුරු අනාවරණය කර ගැනීමට හැකි විය. මෙයින් ඇතැම් ශිලාලේඛන ඒවන විටත් වාර්තා වී තිබූ අතර ඇතැම් ඒවා නවීන සොයා ගැනීම් විය. මෙම සමස්ත ශිලාලේඛන මුලතිව් ප්‍රදේශයේ ඓතිහාසික පසුබිම පිළිබඳ සත්‍යවූත් නිරවද්‍යවූත් තොරතුරු ඉදිරිපත් කරන සාධක වේ.

මෙම ශිලාලේඛන දැනට ස්ථානගත වන පුරාස්ථානවල ස්වරූපයත් එම ප්‍රදේශයේ සිදුවන වර්තමාන සංවර්ධන හා ආගමික පසුබිම තුළ එම ශිලාලේඛනවල පැවැත්ම තීරණය වන ආකාරයත්

---

[1] අභිලේඛන හා නාණකවිද්‍යා අංශය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව
Email: dammibandara@yahoo.com

[2] ගවේෂණ අංශය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

[3] ප්‍රවර්ධන අංශය, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව

**මෙම පර්යේෂණ පත්‍රිකාව මගින් ඉදිරිපත් කිරීමට යෝජිත ය.**

ප්‍රමුඛ පදඃ මුලතිව් දිස්ත්‍රික්කය, පුරාවිද්‍යාත්මක සාධක, ශිලාලේඛන ඓතිහාසික පසුබිම

**Title:** Archaeological Evidence which reveals the Historicity of Mullativu District

**Keywords:** Historical Archaeology, Mullativu, Inscriptions. Historicity